# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2382/05 - 2024 අප්‍රේල් මස 30 වැනි අඟහරුවාදා - 2024.04.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමුව*: MCUDP/LA/MUT(W-14)/14/02.
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ යොමුව*: 4-3/4/2021/LRB/121.

කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ නව මුතුවැල්ල උමං ජලාපවහන මාර්ග ව්‍යාපෘතිය අවසානයේ අදාළ නිවාසවලට පිවිසුම් මාර්ග ලබා දීමේදී සහ ව්‍යාපෘතියේ නඩත්තු කටයුතුවලදී ඇතිවන අවහිරතා ඉවත් කරගැනීම සඳහා පහත විස්තර කර ඇති ඉඩම් කොටස් රජයට අත්කර ගැනීමට ඇති බව 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*අත්කර ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 17 අලුත් මාවත (කොළඹ මහනගර සභා සීමාව තුළ) ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අයත් අලුත් මාවත ග්‍රාමයෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2024.03.15 දිනැතිව පිළියෙල කර ඇති කැඩැස්තර සිතියම් අංක 520406, කලාප අංක 04 පත්‍ර අංක 01හි කැබලි අංක 1 සිට 8 වශයෙන් දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0149 වන පහත විස්තර කර ඇති ඉඩම් කැබලි.

1. **කැබලි අංක 01**
ඉඩමේ නම: වරිපනම් අංක 80/21A වෝල්ස් පටුමග; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන්නාගේ නම: ටී. බාබ්රා ෆෙරේයිරා, කේ. ෂෙරින් ෆෙරේයිරා සහ ඒ. ටිරෝන් ෆෙරේයිරා; ප්‍රමාණය: හෙක්. 0.0066.

2. **කැබලි අංක 02**
ඉඩමේ නම: -; වර්තමාන ඉඩම් පරිහරණය: මාර්ගය; හිමිකම් කියන්නාගේ නම: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0009.

3. **කැබලි අංක 03**
ඉඩමේ නම: වරිපනම් අංක 80/16, වෝල්ස් පටුමග; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන්නාගේ නම: මෝහනදාස් පියන්මදි සහ වයි. එම්. ශ්‍රියාලතා; ප්‍රමාණය: හෙක්. 0.0001.

4. **කැබලි අංක 04**
ඉඩමේ නම: වරිපනම් අංක 80/15, වෝල්ස් පටුමග; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන්නාගේ නම: වයි. එම්. ශ්‍රියාලතා; ප්‍රමාණය: හෙක්. 0.0025.

5. **කැබලි අංක 05**
ඉඩමේ නම: වරිපනම් අංක 80/20, වෝල්ස් පටුමග; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන්නාගේ නම: ඒ. ඇන්ටනි සැමුවෙල්; ප්‍රමාණය: හෙක්. 0.0006.

6. **කැබලි අංක 06**
ඉඩමේ නම: වරිපනම් අංක 80/19, වෝල්ස් පටුමග; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන්නාගේ නම: පී. එස්. කේ. ආශිර්වාදම්; ප්‍රමාණය: හෙක්. 0.0025.

7. **කැබලි අංක 07**

ඉඩමේ නම: වරිපනම් අංක 80/18A, වෝල්ස් පටුමග; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන්නාගේ නම: එස්. පී. නිරංජලා; ප්‍රමාණය: හෙක්. 0.0012.

8. **කැබලි අංක 08**

ඉඩමේ නම: වරිපනම් අංක 80/17, වෝල්ස් පටුමග; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන්නාගේ නම: මොහොමඩ් ඛාන්; ප්‍රමාණය: හෙක්. 0.0005.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය පැවරූ අයවලුන් 2024 ජූනි මස 04 වැනි දින පෙ.ව. 9.30 ට රාජගිරිය, වැලිකඩ, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 03 දරන ස්ථානයේ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ පිහිටා ඇති කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ ඉඩම් අත්කර ගැනීමේ කාර්යාලයේ දී මා හමුවිය යුතුය.

තව ද, 2024 මැයි මස 31 දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම් අත්කර ගැනීම සඳහා වන්දි මුදල් ඉල්ලා සිටීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් ඒ සඳහා ඉල්ලා සිටින වන්දි මුදල හා එය ගණනය කළ ආකාරයත් පිටපත් දෙකක් සහිත ලියවිල්ලක් මගින් මා වෙත ඉදිරිපත් කළ යුතුය.

**එච්. තිලකවර්ධන,**
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය,
කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය.

2024 අප්‍රේල් මස 29 වැනි දින,
කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘති සඳහා වූ ඉඩම් අත්කර ගැනීමේ කාර්යාලයේ දී ය.

EOG 04 - 0236

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.